**සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම - 2022**

**-------------------------------------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගම 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත,

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

**1.5.1** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන ගැටලුව | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | විද්‍යුත් බැංකුකරණය සහ මුදල් තැන්පතු යන්ත්‍ර හරහා සිදුකරන අත්තිකාරම් ගෙවීම් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් නොමැතිකම<br><br>වෙන් කරවා ගැනීමේදී, පාරිභෝගිකයින්ට පහත ක්‍රම භාවිතා කර අත්තිකාරම් ගෙවීම් කළ හැකිය.<br><br>• සීබැන්ක් හොලිඩේ හෝම්ස් ප්‍රධාන කාර්යාලය<br>• අදාළ සීබැන්ක් නිවාඩු නිකේතන<br>• බැංකු තැන්පතු - කවුන්ටර් මඟින්<br>• මුදල් තැන්පතු යන්ත්‍ර (සීඩීඑම්ස්)<br>• විද්‍යුත් බැංකුකරණය<br><br>මුදල් තැන්පතු යන්ත්‍ර භාවිතා කරමින් අත්තිකාරම් ගෙවීම් සිදු කිරීමේදී වෙන්කරවා ගැනීමේ සඳහනක් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. ඇතැම් අවස්ථා වලදී, මාර්ගගත ගනුදෙනු සඳහාද කිසිදු සඳහනක් නොමැත. එබැවින්, ගෙවීමට අදාළ නිශ්චිත විවේක/නිවාඩු නිකේතන හඳුනා ගැනීමට සමාගමට අමතර ප්‍රයත්නයක් දැරීමට සිදුවේ. තවද, එය ස්ථාන අනුව ආදායම හඳුනාගැනීමේ නිරවද්‍යතාවයට බලපායි. | එකඟ වේ. අපි මෙම අංශ හැසිරවීම සඳහා මෘදුකාංග ප්‍රසම්පාදනය කරමින් සිටින්නෙමු.<br>ඉලක්කගත දිනය **2024.03.31** | සමාගමේ බැංකු ගිණුම්වලට හඳුනා නොගත් තැන්පතු අවම කිරීමට/ වළක්වාගැනීමට යෝග්‍ය උපායමාර්ග හඳුන්වාදීම කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු ගිණුම්

| විගණන ගැටලුව | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(i) 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමස්ත ණයගැති ශේෂය රු. 4,185,341ක් වූ අතර එයට දීර්ඝ කාලීන ණයගැති ශේෂයන් ඇතුළත් වේ. සමස්ත ශේෂයෙන් රු.719,686ක් එනම් සියයට 17ක් වසරකට වැඩි කාලයක සිට හිඟව පැවති අතර කාලෝචිත අන්දමින් හිඟ ශේෂයන් අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| කාලය | හිඟ ශේෂය (රු.) |
| --- | --- |
| දින 0-30 | 2,074,560 |
| දින 31-90 | 1,283,065 |
| දින 91-180 | 80,435 |
| 181-365 | 27,595 |
| වසරකට වැඩි කාලයක් | 116,350 |
| අවුරුදු දෙකකට වැඩි | 128,825 |
| අවුරුදු තුනකට වැඩි | 474,511 |
| එකතුව | 4,185,341 |

සමහර දීර්ඝ කාලීන හිඟ ණයගැතියන් 2023 මූල්‍ය වර්ෂය තුළ පියවා ඇත. අපි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන දීර්ඝ කාලීන හිඟ ශේෂයන් සහ ආපසු අයකරගත නොහැකි අයිතමයන් කපා හැරීමේ ක්‍රියාවලියක නිරතව සිටින්නෙමු.
ඉලක්කගත දිනය 2023.12.31

දීර්ඝ කාලීන හිඟ ණයගැති ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 2.49 ක අලාභයක් වූ අතර පෙර වසරට අනුරූපව අලාභය රුපියල් මිලියන 26.7 ක් විය. එබැවින් රුපියල් මිලියන 24.21 ක අලාභයේ අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ අලාභය අඩුවීමට ප්‍රධානතම හේතුව වූයේ ආදායම සියයට 142 කින් ඉහළ යාමයි.

2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම සහ වත්කම් පෙර වසරට සාපේක්ෂව වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත දක්වා ඇත.

| විස්තර | විචලනයේ ප්‍රමාණය වැඩි වීම/ (අඩුවීම) (රුපියල්.) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| අවන්හල් ආදායම | 44,079,309 | 233 | 2021 දී ආදායමට ඇතුළත් අවන්හල් ආදායමට කෝවිඩ් 19 බලපෑ අතර 2022 දී සමාගම ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් විය. |
| වෙන්කිරීමේ ආදායම | 35,666,011 | 193 | 2021 දී වෙන්කිරීමේ ආදායමට කෝවිඩ් 19 බලපෑ අතර 2022 දී සමාගම ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් විය. |
| වෙළඳ ණයගැතියෝ | 2,497,411 | 148 | අනුරාධපුර සී බැන්ක් විවේක නිකේතනයේ සහ විධායක තේ සේවාවල ණය අලෙවිය 2022 දී වර්ධනය වේ. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු වලට අනුව, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| විස්තරය | වර්ෂ 2022 | 2021 |
|---|---|---|
| ලාභදායිතා අනුපාතය | | |
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 47 | 41 |
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | (2) | (48) |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | (5) | (62) |
| හිමිකම් මත ප්‍රතිලාභය අනුපාතය | (4) | (41) |
| ද්‍රවශීලතා අනුපාතය (වාර ගණන) | | |
| ජංගම අනුපාතය (වාර ගණන) | 0.21 | 0.15 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 0.14 | 0.12 |

සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ පාඩු ලැබීම හේතුවෙන් සමාගමේ ශුද්ධ ලාභය, මුළු වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂය තුළ ඍණ අගයන් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් පෙර වර්ෂය හා සසඳන විට සමාගම තවමත් ප්‍රමාණවත් ද්‍රවශීලතා අනුපාත පවත්වා ගැනීමට අපොහොසත් වී ඇති අතර එය සමාගමේ කාරක ප්‍රාග්ධන ගැටලු හට ගැනීමට හේතු විය හැකිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

<table>
<tr><th></th><th>විගණන ගැටලුව</th><th>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(i)</td><td>සමාගම විසින් කළමනාකරණය කරනු ලබන විවේක සහ නිවාඩු නිකේතන සඳහා වෙන්කරවා ගැනීම් (සුබසාධන අරමුණු සඳහා නඩත්තු කෙරෙන ඒවා හැර) සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් (දුරකථනයෙන් හෝ පැමිණීමෙන්) හෝ විවේක නිකේතන (දුරකථනයෙන්) සිදු කළ හැකිය.<br><br>මාර්ගගත වෙන් කිරීම් සඳහා සමාගමේ වෙබ් අඩවිය (www.ceybankholidayhomes.com) ක්‍රියාත්මක නොවන බව හා කිසිදු යාන්ත්‍රණයක් නොමැති බවත් නිරීක්ෂණය විය. තවද ඵලදායි අලෙවිකරණ මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය (උදා: ෆේස්බුක්) කාලානුරූපව යාවත්කාලීන නොකරන බව නිරීක්ෂණය විය.</td><td>වෙබ් අඩවිය භාවිතයෙන් අතහැර දමා ඇති අතර ධාරකය (හොස්ට්) සොයා ගැනීමට අපහට ඇති නොහැකියාව හේතුවෙන් මකා දැමීමටද නොහැක. සියලුම විද්‍යුත් නාලිකා විධිමත් කිරීමට අපි කටයුතු කරමින් සිටින්නෙමු. ඉලක්කගත දිනය 2024.03.31</td><td>ආදායම වැඩි කර ගැනීම සඳහා නව තාක්ෂණය භාවිත කිරීම ඇතුළුව ගත හැකි සෑම පියවරක්ම අනුගමනය කිරීම කළමනාකාරිත්වය තහවුරු කළ යුතුය.</td></tr>
<tr><td>(ii)</td><td>සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ වෙන්කිරීම් අවලංගු කිරීම් සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොමැති බව නිරීක්ෂණය විය.<br><br>වෙන්කිරීම් අවලංගුකිරීම් සහ ආපසු ගෙවීම් සඳහා අනුමත ලේඛනගත ප්‍රතිපත්තියක් නොමැති වීමෙන් අදාළ ක්‍රියාපටිපාටිවල නොගැලපීම් ඇතිවිය හැකි අතර එය පාරිභෝගික අතෘප්තියකට සහ අසාධාරණ ලෙස සැලකීමකට හේතු විය හැකිය.</td><td>සුබසාධන දෙපාර්තමේන්තුවේ වෙන්කිරීම් අවලංගු කිරීමේ ප්‍රතිපත්තියට අපි බැඳී සිටින්නෙමු. තවද, අපි අපේ නව වෙන්කිරීම් අවලංගු කිරීමේ ප්‍රතිපත්තියද කෙටුම්පත් කරන්නෙමු. ඉලක්කගත දිනය 2023.12.31</td><td>කළමනාකරණය විසින් වෙන්කිරීම් අවලංගු කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.</td></tr>
<tr><td>(iii)</td><td>විගණිත දිනට පහත සඳහන් පරිදි සේවා ගිවිසුමකට එළඹීමකින් තොරව සීබෑන්ක් විවේක නිවාස සඳහා ආරක්ෂක සේවා දිගින් දිගටම එකම ආරක්ෂක ආයතන වෙතින් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය විය.<br><br><table><tr><th>විවේක නිවාසයේ නම</th><th>ආරක්ෂක සමාගම</th><th>සේවාව ලබා ගත්තා දින සිට</th></tr><tr><td>අනුරාධපුර</td><td>සදර්න් සිකියුරිටි සර්විසස්</td><td>2004.02.01</td></tr><tr><td>කතරගම</td><td>සීමා සහිත බ්ලැක්හෝක් සිකියුරිටි සින්ඩිකේට් (පුද්ගලික) සමාගම</td><td>2012.09.10</td></tr><tr><td>දික්ඔය</td><td>ටාර්ගට් සිකියුරිටි සර්විසස්</td><td>2016.01.01</td></tr></table><br>තවද, වරින් වර ගාස්තු ඉහළ නංවනු ලැබුවද, එවැනි ආයතන විසින් සපයනු ලබන ආරක්ෂණ සේවාවන් පිළිබඳව ඇගයීමක් කාලානුරූපව සිදු කර නොමැත.</td><td>නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි.<br><br>ඉලක්කගත දිනය 2023.12.31</td><td>නිසි ප්‍රසම්පාදන යාන්ත්‍රණයක් හරහා වලංගු ගිවිසුමකට එළඹීම යටතේ ආරක්ෂක ආයතනවල සේවාවන් තෝරා ගැනීම කළමනාකාරිත්වය විසින් තහවුරු කළ යුතුය.<br><br>තවද, ගිවිසුම් අලුත් කිරීමට පෙර වරින් වර කාර්යසාධන ඇගයීම සිදු කළ යුතුය.</td></tr>
</table>

<table>
<tr>
<td>(iv)</td>
<td>පහත සඳහන් සේවා ගාස්තු බෙදා හැරීම සහ රඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොමැත. (නුවරඑළිය නව නිවාඩු නිකේතනය හැර)
<table>
<tr><th>වර්ගය</th><th>%</th></tr>
<tr><td>කැඩී බිඳී යාම් සඳහා රඳවා තබා ගැනීම</td><td>10</td></tr>
<tr><td>ප්‍රධාන කාර්යාලයේ සේවකයන් අතර</td><td>10</td></tr>
<tr><td>අදාළ ස්ථානයේ සේවකයන්</td><td>80</td></tr>
<tr><td>එකතුව</td><td>100</td></tr>
</table>
</td>
<td>කර්මාන්තයේ භාවිතය අනුව සහ අතීතයේ සිටම සමාගමේ යාන්ත්‍රණයට අනුකූලව මෙය අනුගමනය කළ හැකිය.<br><br>අපි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගෙන විධිමත් කිරීමට කටයුතු කරන්නෙමු.<br><br>ඉලක්කගත දිනය 2023.12.31</td>
<td>අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ඇතිව පරිචය විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.</td>
</tr>
<tr>
<td>(v)</td>
<td>නිවාඩු නිකේතනයේ ස්ථාවර වත්කම් අදාළ ස්ථාවර වත්කම් කේතයන් අනුව ලේබල් කර නොතිබුණි.</td>
<td>නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.<br><br>ඉලක්කගත දිනය 2023.12.31</td>
<td>පවරා ඇති කේත අංකය සමඟ සියලුම ස්ථාවර වත්කම් ලේබල් කිරීම අවශ්‍ය වේ.</td>
</tr>
</table>